ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවේ පරිහානියට හේතුව නිසි පාලනයක් නැති කමයි

ක්‍රිකට් ක්‍රීඩා විස්තර ප්‍රචාරයේ පුරෝගාමී සිංහල නිවේදකයා පාලිත පෙරේරා

මේ ප්‍රවීණ මාධ්‍යවේදියා සමග හෝරාවක් දෙකක් තුළ පත්තර පිටුවක් සැකසීමට නොව පොතක් ලිවීමට තරම් කරුණු ආයාසයකින් තොරව දැනගත හැකියි. තවත් අප සාකච්ඡා කළ බොහෝ කරුණු ඉදිරියේදී හැකි පරිදි ඔබ වෙත ගෙන එමේ බලාපොරොත්තුවෙන් මම නවතිමි. එමෙන්ම නාලන්දාවෙන් බිහිවූ මේ ක්‍රිකට් ක්‍රීඩකයා ශ්‍රී ලංකා ක්‍රිකට් පිටියේ සදා නොදැවෙන ක්‍රීඩකයකු බව ලියා තබමි.

පාසලීය දවසක කීඩාය තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවේ ගමන් මග ඔබ දකින්නේ කෙසේ ද?

ක්‍රීඩාවෙන් පිටතත් කණ්ඩායමේ ක්‍රීඩකයන්ට විවා දුන්න ක්‍රීඩකයන් හිටින ඔව හිතන්ප අයන්නට ලැබෙනවා. ඒ විශේෂ දේශපාලන ඇණිලි ගැසීම් තිබෙන ඔවටත් අයන්න ලැබෙනවා. මේ ගැන ඔබේ අදහස?

දේශපාලන වශයෙන් ක්‍රීඩකයන් තෝරා

අසෝක සිල්වා

එදා කොළඹ සුදු මහත්වරුන්ට හා එම පන්තියට පීවත් වූ ඉංග්‍රීසි කතා කරන අයට සීමා වූ ක්‍රිකට් ක්‍රීඩාව ඈත පිටිසර ගම් දනව් සිසාරා රැගෙන ගියේ ඔහු ය. ඔහුටම ආවේනික වූ බස් වහරක් යොදා ගිනිමින් ඉතා ලයාන්විත හඬකින් ක්‍රීඩා පීටිය තුළ සිදුවන දෑ ඒ අයුරින්ම ක්‍රීඩා ලෝලීන්ගේ මනස තුළ ප්‍රති නිර්මාණය කරමින් ඔහු තරම් සමතකු නොවූ බව අවිවාදිත ය. නාලන්දයෙන් බිහි වූ ක්‍රිකට් ක්‍රීඩකයකු වූ ඔහු විශ්ව විද්‍යාල ප්‍රවේශයෙන් පසු ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට නිවේදකයකු ලෙස සම්බන්ධ වන්නේ 1963 දී ය.

එතැන් පටන් අඩ සිය වසකට ආසන්න කාලයක් ක්‍රීඩා ලෝලීන්ගේ හදවත් තුළ ජීවත් වන පාලිත පෙරේරා නම් වන ඔහු අප සමග කළ කෙටි පිළිසඳරකින් අද ක්‍රීඩා පිටුව සරසන්නට ලැබීම ආකරම් භාග්‍යයක් ද?

ඔහු ප්‍රවීන මාධ්‍යවේදියකු ලෙස නොයෙක් අයුරින් අප මව්බිමට විශාල සේවයක් කර ඇති නමුත් ශ්‍රී ලංකා ක්‍රිකට් පිටියෙන් වෙන් වී කිසි දිනෙක කටයුතු නොකළේ ය. එනිසා ම ඔහුගේම වචන වලින් පැවසීමට උත්සාහ කලොත් "ඉතාම යහපත් කාලගුණයක් පැවති පසුගිය ශනිදා හිරු කිම්හිරිය සිපගන්නට ආසන්න සැදෑවක" නවේවරන් නම් ගම් පියසේ ඔහුගේ පුතනුවන්ගේ නිවසේ ආලින්දයේ සිට අප හෝරා කීපයක් ක්‍රිකට් ක්‍රීඩාව ගැන කතිකාවක යෙදුනෙමු.

ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවේ ප්‍රවර්ධනය ගැන බලන විට 1996 ලෝක කුසලානය දිනා ගැනීම ඉතාම වැදගත් සන්ධි ස්ථානයක් ලෙසි හඳුන්වන්න පුලුවන්. එතැන් පටන් පෙර තිබූ ක්‍රිකට් ක්‍රීඩාව සම්පූර්ණයෙන්ම වෙනස් වුණා. ලෝක කුසලානය මත ක්‍රිකට් ක්‍රීඩාවට මිලක් තියෙව්ම මිට හේතුවයි. ඊට දශක කීපයකට පෙර සිටි මයිකල් තිසේරා අනුව තෙන්නකෝන් එව් අයි කේ ප්‍රනාන්දු සී අයි ගුණසේකර වැනි ක්‍රීඩකයන් ක්‍රිකට් ක්‍රීඩාව කළේ ක්‍රීඩාවට ඇති ආදරය නිසා. එසේත් නැත්නම් ක්‍රිකට් ක්‍රීඩාවට ඔවුන් ප්‍රේම කළා කිව්වොත් නිවැරදියි. ආර්ථික වශයෙන් ඔවුන් යමක් බලාපොරොත්තු වුණේ නැහැ. ඉන් පසු කාලයක ඔස්ට්‍රේලියානු ජාතික කෙරි පැකර් ගේ පිජාමා ක්‍රිකට් ක්‍රීඩාව පටන් ගැනීමත් සමගම ක්‍රිකට් ක්‍රීඩාවේ තිබුණ දිප්තිය "ක්‍රස්දඳරෙ" අලෙවි කරන්න පුලුවන් භාණ්ඩයක් බව ඔවුන් තේරුම් ගත්තා. ඉන් පසුව ඔහු ටෝනි ග්‍රෙග් වැනි අය සමග එක්ව වෙස්ට් ක්‍රිකට් ක්‍රීඩාව පමණක් නොව සමස්ත ක්‍රිකට් ක්‍රීඩාවටම වෙනස් මුහුණුවරක් දෙන්න පුලුවන් බව පෙන්වා දුන්නා.

කෙසේ වෙතත් ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයෝ එවැනි ක්‍රීඩා වලින් ලැබෙන මුදල් ගැන තැකීමක් කළේ නැහැ. මම දන්නවා 1982 ශ්‍රී ලංකාව වෙනුවෙන් ක්‍රීඩා කරන්න එංගලන්තයේ ප්‍රාන්ත කණ්ඩායමක ක්‍රීඩා කළ ඩී එස් ද සිල්වා කැඳවූ අවස්ථාවේ ඔහු ශ්‍රී ලංකාවට ක්‍රීඩා කිරීමට මුදල් හා තරු පහේ හෝටල් පහසුකම් වැනි දෑ ක්‍රිකට් පාලක මණ්ඩලයෙන් ඉල්ලා සිටියා. ක්‍රිකට් පාලක මන්ඩලය එකඟ වුණා. නමුත් ශ්‍රී ලංකා කණ්ඩායමේ අනෙක් ක්‍රීඩකයන් ගෙදර ඉඳන් කාලා බීලා ඇවිත් තරගය ඉවර වුනාම ගෙදර යනවා. මේ ගැන ක්‍රීඩකයන් එකතු කරගෙන ඩී එස් ද සිල්වාට ලබා දුන් පහසුකම් අපටත් ලබා දෙන්න කියා බන්දුල වර්ණාපුර හමු නැතු අවස්ථාවේදී එදා පාලක මණ්ඩලයේ සභාපතිව සිටි ගාමිණී දිසානායක මහතා මගේ කොන්දේසි වලට ක්‍රීඩා කරන්න බැරි නම් ගෙදර යනවා. මම වෙන කෙනෙකු නායකයා ලෙස පත් කරන්නම් කියලා කිව්වා. බන්දුල එදා හඬපු බව මා දන්නවා. නමුත් එය එක්තරා සන්ධි ස්ථානයක්.

ඉන්පසුව මම හිතන විදිහට ටිකෙන් ටික ක්‍රීඩකයන්ට වාත්තිය මට්ටමෙන් සළකන්න පටන් ගත්තා. ක්‍රම ක්‍රමයෙන් ඔවුන්ට මිලක් නියම වුණා. විශේෂයෙන් 96න් පසුව ක්‍රීඩකයන් ක්‍රීඩා කරන්නේ තමන්ගේ ලංසුව හිතේ තියාගෙන. කරුණු කොහොම වෙතත් එදා බන්දුල වර්ණාපුරලා පටන් ගත්තාට වඩා අද ක්‍රිඩාවේ තත්වය "ශ්‍රීකසවහ" ඉතා ඉහළයි. ඊට හේතු තාක්ෂණය ශාරීරික පුහුණු කරවන්න හා මුදල්. ක්‍රීඩකයන්ගේ ජවසම්පන්න කම් වැඩිවීම තුළින් ක්‍රීඩාවට දෙන දායකත්වය ඉහළ ගොස් තිබෙනවා. ඒ නිසාම ජයසූරිය කලුවිතාරණ වැනි සුපිරි ක්‍රීඩකයන් ශ්‍රී ලංකාවෙන් බිහිවෙන්න පටන් ගත්තා. අදවෙනකොට ශ්‍රී ලංකාවේ සංගක්කාර මහේල ඇතුළත් වාත්තය මට්ටමේ ඉහළ කණ්ඩායමක් බිහිවී තිබන්නේ එතියයි.

නමුත් මා විශේෂයෙන් කිව යුතු දෙයක් තියෙනවා. වසර දෙකක විතර කාලයක සිට ලාංකික පිතිකරුවන්ගේ (විශේෂයෙන් මැදපෙළ) ස්ථාවර බවක් දකින්නට ලැබෙන්නෙ නැහැ. හොඳ ආරම්භක පිතිකරු යුගලයක සම්බන්ධීකරණයක් ගොඩ නැගුනෙත් නැහැ. ඒ වගේම අපේ ලෝක පූජිත දඟ පන්දු යවන මුරලිට දැන් දැන් ඒ තරම් විකට් ලැබෙන්නෙත් නැහැ. මෙවැනි තත්වයක් තුළ 2011 ලෝක කුසලාන අවසන් වටයේ තරග වලටවත් මෙවර පැමිනිය හැකිද කියන ප්‍රශ්නාර්ථය අප ඉදිරියේ තිබෙනවා.

ගැනීමක් සිදුවෙනවාද කියන එක නම් මා දන්නේ නැහැ. මට එහෙම දෙයක් පේනන් නැහැ. සමහර විට ක්‍රීඩකයෙක් හෝ දෙන්නෙක් ඔවුන්ට ප්‍රශ්න ඇති වූ අවස්ථා වල පිළිසරණ සොයාගෙන දේශපාලන බලවතුන් ළඟට යන්න ඇති. ඒක ඉතින් ක්‍රීඩාවේ පමණක් නෙවෙයි ලංකාවේ කන්තෝරුවක වුනත් සිදුවන දෙයක්. ලංකාවේ හැම තැනම සිදුවන ලාංකික ලෙඩ රෝගයක් හැරියට එන හඳුන්වන්න පුලුවන්.

නමුත් මා දකින ආකාරයට සමහර ජෙෂ්ඨයන්ට ක්‍රීඩාවෙන් සමුගන්න කාලය හරි. ඒත් ඔවුන් ගෞරවාන්විතව ඉවත්වන්නේ නැතිව තව තවත් රැඳී සිටිනවා. තරුණ දක්ෂ ක්‍රීඩකයෝ දොරට තට්ටු කරමින් අවස්ථාව එනතුරු බලා ඉන්නවා. නම් වලට බය නොවී එම ක්‍රීඩකයන් ඉවත් කිරීමට තේරීම් කමිටුවට කොන්දේස් තිබිය යුතුයි.

ඉන්දියාව පාකිස්ථානය ඔස්ට්‍රේලියාව වගේ රටවල එය සිදුවෙනවා. ඒ අනුව බලනකොට තේරීම් කමිටුව නිවැරදි දක්ෂතම කණ්ඩායම තරග වලට ඉදිරිපත් කරනවාද කියන ප්‍රශ්නය මතුවෙනවා. ඊළඟට අර්ජන රණතුංගගේ සිට කුමාර් සංගක්කාර දක්වා පත්වූ ශ්‍රී ලංකා ක්‍රිකට් පිලේ නායකයන් බොහෝ විට කරන්නේ මට මෙන්න මේ කණ්ඩායම ලබා දෙන්න කියලා තේරීම් කමිටුවට බිස්ටි එක දෙන එක. ඉතින් ඒ අවස්ථා වල තේරීම් කමිටුව අසරණයි. මොකද නායකයන්ගේ මුල් හිඟිල්ලා තියෙනවා සමාජයේ ඉහළ තැන් වලට. ඉතින් ඔවුන් සමග සටන් කිරීම නිෂ්ඵල බව තේරුම්ගෙන ඔවුන් එම කණ්ඩායම ලබා දෙනවා.

සමහර අවස්ථා වල විචාරකයන් වශයෙන් අපි දැකලා තියෙනවා සමහර ක්‍රීඩකයන්ට ක්‍රීඩා කරන්න බැරි අවස්ථා වල පවා ඔවුන් කණ්ඩායමට ඇතුල් කර තිබෙනවා. තේරීම් කමිටුව හරි දේ කොන්ද පෑග ඇතිව නොකරන්නේ නම් එවැනි වෝදනා වලින් ගැළවෙන්න බැහැ. මාවන් අතපත්තු බින්දු 7 කින් පටන් ගත් ක්‍රීඩකයෙක්. ඒත් ඔහු ද්විත්ව ශතක 6 කට හිමිකම් කියන ලෝකයේ පහළ වූ දක්ෂ ක්‍රීඩකයන්ගෙන් කෙනෙක්. අතිත් කාරණය ඔවුන් විශාල මුදලක් උපයනවා. සෑම විදේශ සංචාරයක් සමගම තේරීම් කමිටු සාමාජිකයකු සහභාගි වූ විට සෑම බීම ඉඳුම් නිලුම් වලට අමතරව දිනකට ඇමරිකන් ඩොලර් 300ක් ලැබෙනවා. දින 45ක සංචාරයක් ගියාම ලැබෙන මුදල බලන්න. ඔවුන්ගෙන් මෙම මුදලට සේවයක් විය යුතුයි.

ඉන්දියාවට ඔවුන්ගේ රටේ සිටින මිලියන තුන් හාරසියක රුපවාහිනී තරඟන්නන් නිසා ක්‍රිකට් ක්‍රීඩාවට විශාල මුදල් තන්දරාවක් ඇදී එනවා. ඒ නිසාම අද ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයට පවා බලපෑම් කිරීමට ඔවුන්ට හැකි වී තිබෙනවා. ඉන්දියානු ක්‍රිකට් පාලක මණ්ඩලය තරම් ධනවත් ආයතනයක් මුලු ඉන්දියාවේම නැහැ. කොතරම් දූෂණ මර්ධන ඒකක තිබුණත් අදටත් මුදලට තරග පාවාදීම් ඔටුවු ඇල්ලීම් වගේ සුදු කෙරිගෙන යනවා. ලලිත් මෝදි හැදූ 20/20 කෙරුවාව තුළින් මේ මුදල් ආකරයට තව තවත් මුදල් ගලා එනවා. නමුත් ශ්‍රී ලංකාවේ තත්වය මෙයට වඩා වෙනස්. තවමත් ශ්‍රී ලංකා ක්‍රිකට් පාලනය වන්නේ අත්තර් පාලන මණ්ඩලයකින්. එයට ඇඳි එන මුදල් වගකීමකින් පාලනය වන්නේ නැහැ. මේ මුදල් තමන්ගේ හිතවතුන්ට හිතවත් ක්‍රීඩා සමාජ වලට එසේත් නැත්නම් තමන්ගේ ප්‍රතිරූපය හදා ගන්න වියදම් කරනවා. ඒවා සොබා බලන්න වගකියන්න කෙනෙක් නෑ. මේ මුදල් අයථා අන්දමින් විනාශ කළ අයට දඬුවම් මුණුවන්න කිසිවෙක් නෑ. පිටපු සභාපතිවරු මේ දේ කළා අර දේ කළා කියලා වෝදනා කළත් කිසිවකු හිතිය ඉදිරියට මේ දක්වා ගෙනැවිත් නැහැ. හරියට පුණ්‍ය ආයතනයක් වගේ. මේක තමයි ඉන්දියාවේත් අපෙත් ප්‍රධාන වෙනස.

දැන් ඉන්දියාවේ පවත්වන ටෙස්ට් හා එක්දින තරග මාලාව කලින් යොදාගෙන තිබුණ එකක් නෙවෙයි. ශ්‍රී ලංකාවේ බංකොලොත්භාවය වසා ගන්න ඉන්දියාවෙන් මුදල් ටිකක් ලබා ගන්න සූදානම් කළ එකක්. මා කියන දේ තමයි ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයට ලැබෙන මුදල් පාරදෘෂ්‍යභාවයකින් පාර්ලිමේන්තු කමිටුවකට වගකිවයුතු ආකාරයකට

45 වන පිටුවට

ඔබ කිසු යම්දි ක්‍රිකට් මුදලට යට වුණත් අද ඉන්දියාව වගේ රටවල් ඒ තුළින් විශාල ආර්ථිකයක් ගොඩ නගාගෙන තියෙනවා. දහස් ගාණකට අයත සැළසිලා තියෙනවා. ඒත් ශ්‍රී ලංකාවේ තත්වය එයට වෙනස්. කණ්ඩායමේ නවත්තුවට වත් මුදල් නැති ඔව කියමින් ගිනිමෙන් යනවා. ඊට හේතුව කුමක් ද?